# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

7 ශ්‍රේණිය

## කතෝලික ධර්මය

නම/ විභාග අංකයඃ ......................................... කාලය පැය 2 යි

### I කොටස

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

1. පුරාණ ගිවිසුමේ දිවැසිවරුන් බෙදෙන ප්‍රධාන කොටස් දෙක වන්නේ,
   i. දේශක හා සාමාන්‍ය දිවැසිවරු
   ii. දේශක සහ ප්‍රධාන දිවැසිවරු
   iii. ප්‍රධාන හා සුළු දිවැසිවරු
   iv. දේශක හා ලේඛක දිවැසිවරු
2. කානාන් දේශය හඳුන්වන වෙනත් නමක් වන්නේ
   i. ඌර්
   ii. හාරාන්
   iii. බෙත්ලෙහෙම
   iv. පොරොන්දු දේශය
3. දෙවියන් වහන්සේ ආබ්‍රහම්තුමා සමග ඇති කරගත් ගිවිසුමේ බාහිර සංකේතය වන්නේ,
   i. දේදුන්නයි
   ii. දුම් නගින උදුන
   iii. චර්මච්ඡේදනය
   iv. ගිනි හුල
4. දෙවියන් වහන්සේ හා මනුෂ්‍යා අතර පොර බදා ජයගත් බැවින් ජාකොබ්තුමාට දෙවියන් වහන්සේ දුන් නාමය
   i. ඉශ්‍රායෙල්
   ii. පෙනුයෙල්
   iii. බෙතෙල්
   iv. කානාන්
5. ජේසුස් වහන්සේ උන්වහන්සේ සමඟ සිටින පිණිසත් සුභ අස්න දේශනා කිරීමට යවන පිණිසත්, තෝරාගත් අය වන්නේ,
   i. ප්‍රේරිතයෝ
   ii. අනුගාමිකයෝ
   iii. පූජකයෝ
   iv. සහෝදරයෝ
6. ප්‍රසාද ස්නාපනයේදී අත්‍යවශ්‍ය හා අනිවාර්ය පිළිවෙත වන්නේ,
   i. සාන්තුවර පිහිට පැතීම
   ii. හිසමත ජලය වත්කරමින් ප්‍රසාද ස්නාපනය කිරීම
   iii. සුදු වස්ත්‍ර පැළඳවීම
   iv. හිසමත අත් තැබීම
7. 'මා අනුව එන්න. මම ඔබ මිනිසුන් දිනන්නන් කරන්නෙමි' වදාළේ කා හටද?
   i. ශු. ජාකොබ් තුමාට
   ii. ශු. මතෙව් තුමාට
   iii. ශු. පේදුරු තුමාට
   iv. ශු. ජුවාම් තුමාට
8. ජේසුස් වහන්සේගේ ප්‍රථම ශ්‍රාවකයින් දෙදෙනෙක් වන්නේ
   i. පේදුරු / පුවාම්
   ii. ජාකොබ් / මතෙව්
   iii. ජුවාම් / ජුදාස්
   iv. මතෙව් / ජුවාම්

9. පූජා ප්‍රසාදීන් වහන්සේලා විවිධ ආශිර්වාදයන් දානය කරන විට භාවිතා කරන පොත හඳුන්වන්නේ,
   i. මගේ පළමු ආගම් පොත
   ii. සරල පිළිවෙත් සංග්‍රහය
   iii. ශු. බයිබලය
   iv. මහෝපදේශය

10. පැවිදි පූජක නිකායක් වන්නේ,
   i. මාරිස්ට් සහෝදරතුමන්ලා
   ii. සුරදූතික පැවිදි සොයුරියෝ
   iii. නිර්මල මරිය නිකාය
   iv. ද ලා සාල් සහෝදරතුමන්ලා

11. පූජකවරය නමැති දේව ප්‍රසාද නිධානය දානය කරනු ලබන්නේ,
   i. පූජාප්‍රසාදීතුමා
   ii. තේවාචාරිවරු
   iii. රදගුරුතුමා
   iv. පාප්තුමා

12. පැවිදිවූවන්ගේ ප්‍රධාන කාර්යය වන්නේ
   i. දේව රාජ්‍ය ගොඩනැගීම
   ii. ශුද්ධ ලියවිල්ල කියවීම
   iii. දිව්‍ය පූජාවට යාම
   iv. ශු. පැය කිරීම

13. ආශිර්වාදකාර බන්ධනය ලෝකාරම්භයේදී ......... විසින් ස්ථාපිත කරන ලද ශුද්ධ වූ බන්ධනයකි.
   i. ජේසුස් වහන්සේ
   ii. ශුද්ධාත්මයාණන් වහන්සේ
   iii. දෙවියන් වහන්සේ
   iv. මරියතුමී

14. 'ඔබ කී වචනය ලෙස මට ඉටු වේවා' යි පැවසුවේ,
   i. එළිසබෙත් තුමිය
   ii. මරියතුමිය
   iii. ආනා තුමිය
   iv. තෙරේසා මව්තුමිය

15. 'මව්පියන්ට සංග්‍රහ කිරීම' පනත අයත් වන්නේ,
   i. පළමු පනතටය
   ii. දෙවන පනතටය
   iii. හතරවන පනතටය
   iv. හයවන පනතටය

16. බොරු සාක්ෂි කීමට අපව යොමු කරන්නේ
   i. මිතුරන්ය
   ii. ගුරුවරුන්ය
   iii. වැඩිහිටියන්ය
   iv. සාතන්ය

17. ආශිර්වාදකාර බන්ධනය,
   i. ආරම්භක ප්‍රසාද නිධානයකි
   ii. පව්කමාවේ ප්‍රසාද නිධානයකි
   iii. ජනතා සේවයේ ප්‍රසාද නිධානයකි
   iv. ජීවතුන්ගේ ප්‍රසාද නිධානයකි

18. අප වරදක් සිදු කරන විට අපට ඇසෙන හඬ වනාහි
   i. දෙමාපියන්ගේ හඬයි
   ii. ගුරුවරුන්ගේ හඬයි
   iii. පූජක පැවිදි අයගේ හඬයි
   iv. හෘද සාක්ෂියේ හඬයි

19. ප්‍රධාන දිවැසිවරයෙකු නොවන්නේ,
   i. යෙසායා
   ii. ජෙරමියා
   iii. ආමෝස්
   iv. එසකියෙල්

20. ප්‍රසාද ස්නාපනය ලැබූ අපට හිමිවන ත්‍රිවිධාකාර වගකීම් වලට අයත් නොවන්නේ,
   i. පූජක කැඳවීම
   ii. යාගික කැඳවීම
   iii. එඬේරික කැඳවීම
   iv. දිවැසිවර කැඳවීම

## II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

1.

    i. කතෝලික පූජකතුමන්ලව බෙදිය හැකි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ල. 4)
    ii. පූජකතුමන්ලාගේ සේවාවන් 02ක් ලියන්න. (ල. 4)
    iii. පූජකතුමන්ලා වෙනුවෙන් ඉටු කළ යුතුකම් 02ක් ලියන්න. (ල. 4)
    iv. පූජකවරය දානය කරන මෙහෙයෙහි විශේෂ අවස්ථා 02ක් ලියන්න. (ල. 4)
    v. පදවි පූජකවරුන් විසින් ගන්නා පොරොන්දු 02ක් ලියන්න. (ල. 4)

2.

    i. ආදීපීතෘ ඊසාක්තුමාගේ දරුවන් දෙදෙනාගේ නම් ලියන්න. (ල. 2)
    ii. ආබ්‍රහම් තුමාට මුහුණ දීමට සිදු වූ අභියෝග 03ක් ලියන්න. (ල. 3)
    iii. ඊසාක්තුමාගේ ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ 05ක් ලියන්න. (ල. 5)

3.

    i. ප්‍රසාද ස්නාපනයේදී පාස්කු ඉටි පහන දල්වා ගැනීමේ අර්ථය කුමක්ද? (ල. 2)
    ii. ප්‍රසාද ස්නාපන පිළිවෙතෙහි අවස්ථා 03ක් ලියන්න. (ල. 3)
    iii. ප්‍රසාද ස්නාපනය ලබා යහපත් කිතුනු දරුවෙකු ලෙස ජීවත් වීම සඳහා ඔබට කළ හැකි දේවල් 05ක් ලියන්න. (ල. 5)

4.

    i. කිතුනු විවාහයේ ලක්ෂණ දෙක නම් කරන්න. (ල. 2)
    ii. දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටුවිය යුතු යුතුකම් 03ක් ලියන්න. (ල. 3)
    iii. පාසල වෙනුවෙන් ඔබ ඉටුකළ යුතු යුතුකම් 05ක් ලියන්න. (ල. 5)

5.

    i. දස පනතේ දෙවන කොටසට අයත් පනත් 02ක් ලියන්න. (ල. 2)
    ii. ක්‍රිස්තුන් වහන්සේ ලොවට හඳුන්වාදීමට ඔබට කළ හැකි දේවල් 03ක් ලියන්න. (ල. 3)
    iii. බොරු කියන මිතුරෙකු හෝ මිතුරියකට එම වරද පහදා දෙමින් ඔබ දෙන අවවාද 05ක් ලියන්න. (ල. 5)

6. පහත මාතෘකා අතරින් 02 තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

    i. ආදීපීතෘ ආබ්‍රහම්තුමා
    ii. ජෝනා දිවැසිවරයා
    iii. ප්‍රසාද ස්නාපනය
    iv. ආශිර්වාදකාර බන්ධනය
    v. ඊසාක්තුමා

(ල. 10)